**කැන්විල් හොල්ඩින්ග්ස් පෞද්ගලික සමාගම - 2018**

**-----------------------------------------------------------**

**1.1** **මතය**

කැන්විල් හොල්ඩින්ග්ස් පෞද්ගලික සමාගම (“සමාගම”) සහ එහි පරිපාලිතයන්හි (“සමූහය”) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගම සහ සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**කරුණු අවධාරණය කිරිම**

මාගේ මතය තත්ත්වාගණනය නොකරමින් කැන්විල් හොල්ඩින්ග්ස් පෞද්ගලික සමාගමේ පරිපාලිත සමාගම් වන හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සිනො ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) යන සමාගම්හි මූල්‍ය ප්‍රකාශනවල සටහන් කෙරෙහි අවධානය යොමුකරමි.

**හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්**

- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මේ උපකල්පනය දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන් 2.5

ඉහත සටහනේ දක්වා ඇති පරිදි, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හම්බන්තොට හෝටලය ඉදිකිරීම අත්හිටුවීම සඳහා යෝජනාවක් සම්මත කරගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ හෝටලය ඉදිකිරීමමේ ක්‍රියාකාරකම් අත්හිටුවා ඇත. තවද අංක 17/1613/733/029 දරන 2017 අගෝස්තු 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, කැන්විල් හොල්ඩින්ග්ස් පෞද්ගලික සමාගම(මව් සමාගම) හි කොටස් හිමිකාරිත්වයට සමානුපාතික වන ලෙස එහි කොටස් හිමියන් වෙත සමාගමේ කොටස් සංඛ්‍යාව පැවරීමට රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශය මගින් උපදෙස් ලබා දී තිබුණි. වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන ස්වාධීන තක්සේරුව මත පදනම්ව හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් හි කැන්විල් හොල්ඩින්ග්ස් පෞද්ගලික සමාගම (“සමාගම”) අත්පත් කරගෙන තිබෙන කොටස් පැවරිය යුතුය.එනිසා අපේක්ෂා කල හැකි අනාගත කාලයකදී සමාගම ඇවර කිරීමට යෝජනාවක් සම්මත කරගෙන නොමැත. එම නිසා අඛණ්ඩ පැවැත්මේ උපකල්පනය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය.

**සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) සමාගම**

- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මේ උපකල්පනය දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන් 2.6
  ඉහත සටහනේ දක්වා ඇති පරිදි, සමාගම අඛණ්ඩ පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සමාගමේ කළමනාකාරිත්වය විසින් ඇගයීමක් කර ඇති අතර අපේක්ෂා කල හැකි අනාගත කාලයක් දක්වා ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යාමට එයට සම්පත් ඇති බවට සෑහීමට පත්වේ. තවද, සමාගම අඛණ්ඩ පවත්වාගෙන යාමේ හැකියාවට සැලකිය යුතු සැකයක් ඇති කල හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන්

කිසිවක් පිළිබඳ කළමනාකාරිත්වය දැනුවත්ව නැත. මීට අමතරව, ග්‍රෑන්ඩ් හයට් කලම්බු (GHC) හෝටලය නැවත පැවරීම සඳහා සහ දේපොළ වෙළඳාම් අලෙවිකරණය පිළිබඳ පූර්ව ජාත්‍යන්තර අත්දැකීමක් ඇති දේශීය හා ජාත්‍යන්තර උපදේශකයන්ගෙන් උනන්දුව ප්‍රකාශකිරීම් (EOI) කැඳවීම සහ නියමිත ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු ගනුදෙනු උපදේශකයෙකු තෝරා ගැනීම සඳහා 2017 අගෝස්තු 01 දින (කැබිනට් තීරණ අංක 17/1613/733/029) අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

තවද, අවසන් වීමට ඉතිරිව ඇති නැවත පැවරීමේ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්කරුවන් සමඟ ඇති කර ගෙන ඇති වර්තමාන කොන්ත්‍රාත් වලට ගරු කිරීමක් ලෙස සහ දීර්ඝ කිරීමේ පිරිවැය වළක්වා ගැනීමට බැංකුවෙන් අතුරු ණයක් ලබා ගැනීම සඳහා සහාය වන ලෙස 2018 ජනවාරි 10 වන දින ආර්ථික කළමනාකරණ කැබිනට් කමිටුව (CCEM) විසින් පුද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය සඳහා වූ ජාතික ඒජන්සියට (NAPPP) උපදෙස් දී ඇත. ඒ අනුව සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 12 ක ණයක් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් සිටින අතර එමඟින් වර්තමාන බුන්වත්භාවය විසඳෙනු ඇත. යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන මඟින් සමාගමේ කොටස් හිමිකාරිත්වයේ ව්‍යුහය පමණක් වෙනස් වනු වේ, එම නිසා අපේක්ෂිත අනාගත කාලයක් දක්වා අඛණ්ඩව පවතී යන්න සහ ඇවර කිරීමට අදහස් නොකරයි යන පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

- අසම්භාව්‍ය වගකීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල සටහන් 22

  ඉහත සටහනේ දක්වා ඇති පරිදි, 2015 මාර්තු 27 දිනැති ලිපිය මඟින් පසුව අවසන් කර ඇති, අභ්‍යන්තර අලංකරණ කොන්ත්‍රාත්තුව (කොන්ත්‍රාත් වටිනාකම යුරෝ 28,869,372) පිරිනමා තිබූ ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා (ඉටලි) විසින් සමාගමට එරෙහිව බේරුම්කරණයක් පනවා ඇත. සිදු කරන ලද වැඩ, ලාභය අහිමි වීම සහ කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහා දරන ලද පිරිවැය සඳහා ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා (ඉටලි) විසින් යුරෝ 20,552,242 ක් ඉල්ලා ඇත. එසේම බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා දරන ලද පිරිවැයද ප්‍රතිපූර්ණය කල යුතු බවට ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා (ඉටලි) විසින් ඉල්ලීම් කර ඇත. ඉහත බේරුම්කරණය සඳහා තීන්දුව අධිකරණය විසින් 2017 සැප්තැම්බර් 29 වන දින නිල වශයෙන් දැනුම් දෙන ලදී. බේරුම්කරණ තීන්දුව ප්‍රකාරව, හිමිකම් කියන තැනැත්තාට යුරෝ 7,432,062.79 ක මුදලක් නියම කර ඇත.

  ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා හි හිමිකම් පෑම විභාග කිරීමට හෝ නිශ්චය කිරීමට බේරුම්කරණ විනිශ්චය සභාවට අධිකරණ බලයක් නොමැත යන පදනම මත, ඉහත සඳහන් බේරුම්කරණ තීන්දුව ශ්‍රී ලංකාව තුල බලාත්මක කිරීම සඳහා ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා විසින් කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති නඩුව සමාගමේ කළමනාකාරිත්වය විසින් අභියෝගයට ලක් කර ඇත. තවද, සමාගම සහ ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා (ඉටලි) අතර 2015 ජනවාරි 07 දින (ජනාධිපතිවරණයට දිනකට පෙර) ඇති කර ගත් මතභේදාත්මක ගිවිසුම රටේ පොදු ප්‍රතිපත්තියට පටහැනි බැවින්, ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා වෙත නියම කරන ලද හිමිකම් පෑම අනුමත කල නොහැක යන මතයේ සමාගම ඇත. ඉහත තොරතුරු මත පදනම්ව ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා (ඉටලි) විසින් කරන ලද හිමිකම් පෑම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොමැත.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම සහ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගම සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගම සහ සමූහයේ  මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම සහ සමූහයේ  වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා  විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී  අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගම සහ සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගම සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ.  කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගම සහ සමූහයේ  අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගම සහ සමූහය කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගම සහ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම සහ සමූහය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2017 වර්ෂයේදී සමාගම වියදම් පහක් සඳහා රු.389,840 ක ප්‍රතිපාදන සලසා නොමැත. මේ නිසා සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 සමඟ අනුගත නොවී ඇති අතර එය සමාලෝචිත වර්ෂය තුළදී පියවා සහ ලාභ අලාභ ගිණුමෙන් කපාහැර ඇත. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | ප්‍රමිතයට අනුකූලව කටයුතු කල යුතුය. |

## 1.6 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2016 ඔක්තොම්බර් සිට 2018 ඔක්තොම්බර් දක්වා, කාර්යසාධන කළමනාකරණ සහ ඉදිකිරීම් කළමනාකරණ (PMCM) දීමනාව සඳහා වූ උපයන විට ගෙවීම් බද්ද රු.2,624,170 සමාගම විසින් ගෙවා ඇති අතර මුදල් අමාත්‍යාංශය විසින් 2016 අප්‍රේල් 29 දින නිකුත් කරන ලද නො.PED 03/2016 චක්‍රෙල්ඛය සමඟ අනුගත වී නොමැත. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.18,477,650 ලාභයක් වූ අතර ඊට අනුරූප වර්ෂයේ ලාභය රු165,373,105 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 146,895,455 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ලාභාංශ ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාගමේ සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම පහත සඳහන් වගුවේ දැක්වේ.

| වර්ෂය | **2018** | **2017** |
|---|---|---|
| | රු. | රු. |
| මූල්‍ය ආදායම | 25,564,060 | 38,088,317 |
| අනෙකුත් ආදායම් | 8,833,840 | 200,000,000 |
| පරිපාලන වියදම් | 8,725,269 | 7,869,756 |
| බදු පසු ශුද්ධ ලාභය | 18,477,650.40 | 165,373,105.08 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

මූලය ප්‍රකාශනවලට සහ විගණනයට සපයන තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ සමහර වැදගත් අනුපාත පහත දැක්වේ.

| **අනුපාත** | **2017** | **2018** |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 11.21 | 7.07 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 11.21 | 7.07 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය | 0.10 | 0.88 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව නිලධාරීන් හතර දෙනෙකු සඳහා රු. 1,700,000 ක කාර්යසාධන කළමනාකරණ සහ ඉදිකිරීම් කළමනාකරණ දීමනාව (PMCM) සමාගම ගෙවා ඇත. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | හිමිකම තහවුරු කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| ආ) දීමනාවේ ප්‍රමාණය, දීමනාව ලබා දෙන නිලධාරීන්ගේ තොරතුරු සහ වර්ෂය තුල ගෙවූ දීමනාව සඳහන් කිරීමකින් තොරව කාර්යසාධන කළමනාකරණ සහ ඉදිකිරීම් කළමනාකරණ දීමනාව ලබා දීමේ ලිපි සමාගම විසින් නිකුත් කර ඇත. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | දීමනාවේ ප්‍රමාණය, නිලධාරීන්ගේ තොරතුරු සහ වර්ෂය තුල ගෙවූ දීමනාව ලබා දීමේ ලිපියේ ඇතුලත් කල යුතුය. |

| තනතුර | ලිපියේ දිනය | පිළිගත් දිනය | 2018 වර්ෂය තුල මසකට ලද මුදල (රු) |
|---|---|---|---|
| It-ELV සම්බන්ධීකාරක | 24/01/2018 | 02-05-2018 | 20,000 |
| ප්‍රමාණ තක්සේරුකරු | 24/02/2018 | 04-11-2018 | 25,000 |
| MEP-ඉංජිනේරු | 23/02/2018 | 17/04/2018 | 25,000 |
| ප්‍රධාන ගෘහනිර්මාණ ශිල්පී | 02-08-2018 | 02-09-2018 | 50,000 |

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇ) ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර පුරප්පාඩු වූ හේතුවෙන් ගණකාධිකාරී සහ සහකාර ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු සඳහා කාර්යසාධන කළමනාකරණ සහ ඉදිකිරීම් කළමනාකරණ දීමනාව ප්‍රදානය කරන ලදී. 2016 නොවැම්බර් 11 දින නව ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයෙකු සමාගම පත් කලද දීමනාව තවදුරටත් ඔවුන්ට ගෙවනු ලැබේ. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | ගණකාධිකාරී සහ සහකාර ගණකාධිකාරීවරුන් දෙදෙනා සඳහා කාර්යසාධන කළමනාකරණ සහ ඉදිකිරීම් කළමනාකරණ දීමනාව ගෙවීම නවතා |

| | | |
|---|---|---|
| | | දැමිය යුතුය. |
| ඇ) සමාගම රාජ්‍ය ව්‍යවසාය සඳහා වූ මාර්ගෝපදේශයට අනුකූල නොවී නිලධාරීන් පස් දෙදෙනෙකු කළමනාකාරණ අධ්‍යක්ෂකවරයා විසින් බඳවා ගෙන ඇත. මෙම නිලධාරීන් බඳවා ගැනීමෙන් පසුව සේවයට පැමිණ නැත. නමුත් සමාගම එම නිලධාරීන් බඳවා ගැනීමේ දිනයේ සිට සේවා ගිවිසුම අවසන් වන තෙක් ගෙවා තිබුණි. තොරතුරු පහත සඳහන් පරිදි වේ. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | මාර්ගෝපදේශයට අනුව කටයුතු කල යුතුය. |

| තනතුර | බඳවාගත් දිනය | මාසික දීමනාව (රු) |
|---|---|---|
| මානම සම්පත් සමබන්ධීකාරක | 2015 නෙවැම්බර් 1 | 40,000 |
| කළමනාකරණ උපදේශක | 2015 අප්‍රේල් 1 | 100,000 |
| අමාත්‍යාංශ සමබන්ධීකාරක | 2017 මැයි 1 | 70,000 |
| I.T සමබන්ධීකාරක | 2016 ඔක්තෝම්බර් 1 | 45,000 |
| BOI සමබන්ධීකාරක | 2016 නෙවැම්බර් 1 | 40,000 |